
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor* : Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



# සහෝදරත්වයෙන් හා සාමයෙන් පිරුණු අසිරිමත් නත්තලක්!



**ගි**රා, මොණර, සැළලිහිණි පියාසර කළ අලි කොටි වග වළසුන් සැරිසැරූ මහා වනාන්තරය....
කඳු හෙල් අතරින් ගලාබසිමින් කෙත්වතු සරුසාර කළ ජලධාරා....
තම දරු පවුල් රැකගන්නට
කරිදියෙන් නැහැවුණු මිනිසාට සහාය වූ මහා සාගරය.....

මෙවන් වටිනා සම්පතින් සැරසි සිටි අති රමණීය ශ්‍රී ලංකාව, අපගේ ආදරණීය මාතෘභූමිය අද සීමා බන්ධන අතර සිරවී, කොටුවී, බියෙන්, සැකෙන් දිවි ගෙවයි. විවිධාකාර හැඩ තලවලින්, වෛවර්ණ පැහැයෙන් හා ඵලයෙන් අලංකා රව සිටි මහ වෘක්ෂයෝ, සියල්ල හැරදමා වියලි කඳන් සේ අහස දෙස බලා සිටිති. මුළු පරිසරයම සීතලෙන් හා අඳුරු වළාවෙන් වැසීයද්දී තුරු ලතාවෝ නව ජීවිතයකට සූදානම් වෙමින් ගැඹුරු නිහඬතාවකින් හා බලාපොරොත්තු වෙන් යුතුව කල් ගෙවති.

විවිධාකාර අත්දැකීම් මැද කඳුළු සලන ලක්වැසි ජනතාවට ශීතසෘතුවේ පරිසර නිහඬතාව කිසියම් සුවිශේෂ පණිවුඩයක් රැගෙන එයි.

කිතුණුවන් ලෙස නත්තල සමරන්නට සූදානම් වන අපි සොබාදහමේ සැඟවී ඇති අපූර්වතම අරුත වටහා ගනිමු. බලාපොරොත්තුවෙන් හා අධිශ්ඨානයෙන් යුතුව අපිදු නව ජීවිතයකට පියවර නගමු. සිත් හැරීමකින් හා සමාව දානය කරමින් සැබෑ කිතුණුවන් වන්නට පෙරමුණ ගන්නා ලෙස නත්තල අපට අභියෝග කරයි. මේ සඳහා ජන චන්ද නාව නිරන්තරයෙන් අපට මග පෙන්වයි.

මෙලොව නිතර සිදු වන විවිධාකාර වෙනස්කම් හඳුනාගනිමින් යුක්තිය සහ සාධාරණත්වය ගොඩ නගන්නට වෙහෙසෙමු. නිරන්තරයෙන් නගනා සෝ සුසම් ලෑමට, වේදනාවට සංවේදීවෙමින් එකිනෙකා සනසමු.

සමාජ වටිනාකම් වලට යට නොවී කිතු සමිඳුන් පෙන්වන දුෂ්කර මාවත තෝරාගෙන සියළුම ලක් දරුවන්ගේ උදාරත්වය වෙනුවෙන් කැපවෙමු. කිතු සමිඳුන් මිනිසත් බව ගෙන මෙලොවට වැඩියේ අප සැම සමගි කරන්නටයි. සහෝදරත්වයේ සමාජයක් ගොඩනගන්නටයි. සියළු බාධක මැඩගෙන කිතුණු පණිවුඩය ගෙදරට ගෙන ආ මුල් කිතුණු සභාව ලෙස අපිදු බිඳ වැටී ඇති සහෝදරත්වයට පණ දෙන්නට මෙම ලබන්නාවූ නත්තලේදී පෙරමුණ ගනිමු.

දේව ස්වරූපය එකිනෙකා තුළ දකිමින්, සානුකම්පික වෙමින් නව ජීවිතයක් උදා කළ කිතු සමිඳුන්ගේ ආදර්ශය ජන හදවත් තුළ ජනිත කරන්නේ නම් සාමය අප දෙරණ තලයේ නගා සිටුවීම එතරම් අපහසු කාර්‍යයක් නොවේ.

සැබෑ ලෙස නත්තල සමරන්නට එකමුතු කම හා සහෝදරත්වය වෙනුවෙන් වෙහෙසෙන සියලු දෙන සමග අත්වැල් බැඳ ගනිමු.

එකම ලක් මාතාවගේ දරුවන් ලෙසින් සාමයේ රජිඳාණන්ට අයැදිමු, මෙලෙසින් මේ නත්තල් සමයේ.....

වඩින්න සමිඳුනි....
යුදගිනි නිවාලන්නට....
අප සැම සමගිකරන්නට....
අතීත සිදුවීම් තුළින් මිදෙන්නට....
ප්‍රේමයේ අසිපත අතට ගන්නට....
අසීමිත ලෙස ආදරය කරන සමිඳේ
ගොඩනගන්න නව දේශයක්
ඔබගේ දරුවන්ට.....

ඔබ සැමට සහෝදරත්වයෙන් හා සාමයෙන් පිරුණු ඉතා ශුභ නත්තලක් වේවායි ඉත සිතින් පතමු!

♦ ***සෙලින් නානායක්කාර***
**කන්‍යා සොහොයුරිය**
**Leeds UK**

## සිංහළ ගොන්කම් කවදා ඉවරවේද?

**ශ්‍රී** ලංකාවේ බහුතරය වන සිංහලයින් මෝඩ මිනිසුන් ජාතියක් යයි ද, ඔවුන් ලෙහෙසියෙන් රවටන්නට හැකි පිරිසක් ලෙස ද, ඒ සමගම ඔවුන් පුහු මාන්නයෙන් පිරුණු ජන කොටසක් වශයෙන් ද දෙමළ ජනයා ඇතුලු ලංකාවේ වෙසෙන සුලු ජාතීහු සිතති. ඔවුන්ගේ ඒ සිතුවිල්ල ලංකාව වටා ඇති රටවලට ද ප්‍රචාරය කර හැරීමේ හේතුවෙන් අපේ අසල් වැසියා වන ඉන්දියාව ද එම නිගමනයට බැස සිටියි.

අසිංහලයින් දරන එම මතයට ඌන පූරණයක් කළ යුතුයයි මට දැන් සිතේ. එනම් සිංහලයින්ගේ අති පණ්ඩිතකමත් එයට එකතු කිරීම ය. මෙහි දී **පණ්ඩිතකම** යන වචනය යොදන්නේ ඉන් සාමාන්‍යයෙන් ගම්‍ය වන අර්ථ යට වඩා ඊට හාත්පසින්ම විරුද්ධාර්ථයක් දැනවීම සඳහා ය. එබැවින් එම **පණ්ඩිතකම ගොං පණ්ඩිතකම** යනුවෙන් හැඳින්නුවාට ද වරදක් නැත. සිංහළයන්ගේ මේ ගොං පණ්ඩිත කම සක්සුදක් සේ ඔප්පුවන සිද්ධියක් දැනට සති දෙකකට පෙර නුගේගොඩ සිදුවූ බෝම්බ පිපිරීමේ ඛේදවාචකයේ දී අපට අසන්නට ලැබිණ. එම පිපිරීම සිදුවී ඇත්තේ මෙසේ ය.

කොළඹ එදාම උදේ ඇමති ඩග්ලස් දේවානන්දගේ කාර්‍යාලයට පැමිණි කොටි බෝම්බකාරියක් බඩේ බැඳගෙන ආ මරාගෙන මැරෙන බෝම්බයක් එහිදී පුපුරවා ගත්තා ය. හවස නුගේගොඩ හන්දියේ පිහිටි **නෝ ලිමිට්** නම් සාප්පුවට පැමිණි හමුදා නිල ඇඳුමට සමාන ඇඳුමකින් සැරසුණු එක් මිනිසෙක් (සාමාන්‍යයෙන් සෑම පාරිභෝගිකයෙකුම කරන්නාක් මෙන්) සාප්පුවට ඇතුල්වන තැන සිටි ආරක්ෂක නිළධාරියාට තමා ගෙන ආ බඩු පාර්සලයක් දී තුණ්ඩුවක්ද ලබාගත්තේය. ඔහු සාප්පුව ඇතුළට නොගොස් එළියට ගියේය. ඔහුගේ හැසිරීම ගැන සැකකළ සිකියුරිටිගාඩ් වහාම පොලිසියට ටෙලිපෝන් කර සැකකට යුතු පාර්සලයක් තිබෙන බව දැනුම් දුනි. එහෙත් බොහෝ වේලාවක් ගත වීත් පොලීසිය ආවේ නැත. පොලීසිය නා නිසා ආරක්ෂක නියාමකයා එළියට ගොස් නුගේගොඩ හන්දියේ වත් පොලිස්කාරයෙක් ඇත්දැයි සෙවීය. වාසනාවට එතැන ඒ වෙලාවට සාමාන්‍යයෙන් ඇති වාහන තදබදය හසුරුවමින් පොලිස් නිලධාරියෙක් සිටියේය. (දැන් බලන විට එය නම් වාසනාව නොව අවාසනාවය) ඔහු සිකියුරිටි නියාමකයා සමග සාප්පුවට ආවේ ය.

අර පාර්සලය අතගා බැලූ පොලිස් නිලධාරියා “ මට කතුරක් ගෙනැල්ලා දෙන්න” යයි කීය. ඔහු බෝම්බ විශේෂඥයෙක් වත් බෝම්බයක් කිසිදිනක දැක ඇති මිනිහෙක්වත් නොවේ. ඔහුට කතුරක් ලැබිණ. මේ තකතිරු මෝඩයා කතුරෙන් පාර්සලය කැපීය. සැණකින් සාප්පුව ගිගුරුම් දෙන පිපිරීමක් සිදුවිය. අර පොලිස්කාරයා ද සිකියුරිටි පිරිස ද සාප්පුවට ආ පාසැල් ළමයින් ද ඇතුලුව 19 දෙනෙක් නිරපරාදේ මරුවාට බිළිවුහ.

මෙවැනි මෝඩකම් නොදියුණු අප්‍රිකානු රටකවත් සිදු නොවේ. එහෙත් මේ 21 වෙනි ශතවර්ෂයේ සිංහළ මිනිසා ය. සිංහලයා අමු මෝඩයායයි කී විට සිංහලයින්ට තදවේ. නමුත් කරන්නට දෙයක් නැත. ඒ කතාව ඇත්ත ය

## කිතු උපත

**රැයේ සරදා කාසයේ
දිලි දිලී නැග ආ
තරුව මහ සළකුණු කියා
රජුන් එහි වැඩියේ**

**දිළිඳු ගව හල තුළ එදා
අසිරිමත් පුතණුන්
ලොවට බිහිවී එම රැයේ
නිදයි මව් ඇකයේ**

**සෙමින් ඇතුළට පිවිසෙමින්
පුදා තුටු පඬුරුත්
රජවරුන් තිදෙනා බැතින්
බිළිඳු පා නමදිත්**

**එසේ ගරු බුහුමන් කළේ
වෙසෙස් බිළිඳෙකුටයි
ඒ බිළිඳු ලොකු මහත්වී
ලොවට සෙත දෙන්ටයි**

♦ ***ක්‍රිෂාන්ති වීරමන්***

## Would You Follow ?

How many would follow the star tonight
If it shone past the Milky Way,
Leave comfortable homes and follow it still,
Over the hills and away.

How many would open their doors tonight
For a weary and shabby pair ?
Make room at hearths for a Stranger-Child,
Though the Infant be wondrous fair ?

How many would give of their goods tonight,
The best they possess and more,
For their faith in a star and an angel choir
And a King forevermore?

We censure the folk of a bygone time
For indifference to Mary's plight.
How many would do any better now?
Would you follow the star tonight?

**- Author Unknown**

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

**කුර්වන්නපි ව්‍යලිකානි - යං ප්‍රිය: ප්‍රිය එව ස:
අශෙෂ දොෂ දුෂ්ටොපි - කාය: කස්‍ය න වල්ලභ:**

***අර්ථය*** : *යමෙක් ප්‍රිය වේ නම් වැරදි කරන්නේ නමුත් ප්‍රියවේමය. සියළු දෝෂයන්ගෙන් ගහණ වුවත් ශරීරය කවරෙකුට අප්‍රියවේද?*

**සා**මාන්‍ය ජීවිතයේ දී අපට බොහෝ සමීප සරල අදහසක් මෙම පද්‍යයෙන් පැහැදිලි කර ඇත. යමෙක් අපට ප්‍රිය නම් ඔහු හෝ ඇය කරන ඕනෑම හොඳක් හෝ නරකක් ඉවසීමට අපට පුළුවන. ඒ අපි ඔහුට හෝ ඇයට ඇළුම් කරන හෙයිනි. දරුවන් කොතරම් වැරදි කළත් දෙමාපියන් දරුවන්ට ප්‍රිය වන්නේ ඒ නිසයි. එවැනි අවස්ථාවල දෙමාපියෝ දරුවන් කෙරෙහි අහිතක් අමනාපයක් ඇතිකර නොගනිති. ඔවුනොවුන් කෙරෙහි ඇළුම් කරන ස්වාමි භාර්‍යා දෙදෙනගේත්, හිත මිතුරන් අතරේත්, සහෝදර සහෝදරියන් කෙරෙහිත්, ඥාතීන් අතරත් මේ දහම එකසේ ක්‍රියාත්මක වන බව පෙනේ. මේ අනුව හිතවත්, ප්‍රියමනාප, තමන් ඇළුම් කරන අයගේ අවැඩක් වුවත් හොඳක් ලෙස දකිමින්, අහිතවත්, අමනාප අයගේ හොඳ දේ පවා නුහුරට පෙනෙනවා ඇත.

නොහොඳ දේ හොඳයයි අනුමත කිරීම නිසා ඔවුන්ටත් සමාජයටත් වන හානිය සුළුපටු නොවේ. මෙයට නිදසුන් ලෙස එක් ජනකතාවක් සඳහන් කළ හැකි ය.

දිනක් පාසැලේ දී ළමයෙකුගේ පැන්සලක් සොරකම් කරගෙන ආ තම පුතු සතුටින් පිළිගත් මව එය අගය කළා මිස එය නරක දෙයක් ලෙස පුතුට දඬුවම් කළේවත්, අවවාද කළේවත් නැත. ඉන් මහත් ආඩම්බරයටත්, ධෛර්‍යයටත් පත් පුතා දිගටම සොරකම් කරන්නට පටන්ගත්තේය. අවසන මහ සොරෙකු බවට ඔහු පත්විය. සොරකම් කිරීම දිගටම කරගෙන යද්දී දිනක් මේ පුද්ගලයා පොලීසියට හසුවිය. ඔහු අවසන් වතාවට තම මව හමුවී පණිවුඩයක් කීමට අවසර ඉල්ලා සිටියේය. අවසරය ලද ඔහු මවට රහසක් කීමට යයි මවගේ කනට ළංව “ මුල්ම දිනයේ සොරකම් කළාට දඬුවම් නොකර ඊට අනුබල දුන් ඔබට මගේ ස්තූතියයි ” මේ කියා මවගේ කන සපා කෑවේය. මේ කතා පුවතට අනුව පුතා මව සැතිරියක ලෙ දකින්නේ නොතේරෙන වයසේදී සොරකම් කරන්නට අනුබල දුන් හෙයිනි.

මෙහි එන උපදේශය නම් සියළු දෝෂයන්ගෙන් යුක්ත වුවත් තම ශරීරය තමාට ප්‍රියමනාප බවයි. අප ශරීරය කොතරම් දුක් ගැහැට ගෙන එන එකක්ද කියා අමුතුවෙන් කිව යුතු නොවේ. එය නිතර දෙවේලේ රෝග පීඩා දුක් වේදනාවලින් වද දෙන්නකි. සෑම මොහොතකම වෙනස්වීමේ ස්වභාවයට යටත්ය. කෙස් හා දත් වැටේ. ඇස් දුබල වේ. කන් නෑසී යයි. අතපය අවනත නොවේ. කෙළවරක් නැති ලෙඩ රෝග ය. වයසට යාමේදී අනේක අබල දුබලකම් ඇතිකරමින් මහත් පීඩා ගෙන දුන්නද අපේ ශරීරය අපට අතිශයින් ප්‍රිය මනාප ය.

කොතරම් රෝග පීඩාදියට ලක්වුවද එය ප්‍රකෘති තත්වයට ගෙන ඒමට අපි උත්සුක වෙමු. කිසි විටෙක එහි පිළිකුල් ස්වභාවයක් නොපෙනේ. කෘතිම සායම් ගා කෙස් කලුකරන්නේත්, බොරු දත් දමන්නේත්, සුවඳ විලවුන් ගල්වන්නේත් ශරීරයට ඇති එම ප්‍රියමනාප බව නිසයි. ශරීරයේ යථා ස්වභාවය තේරුම් ගැනීමට අප උත්සාහ කරන්නේ නැත. ඒ අන් කිසිවක් නිසා නොව අපේ ශරීරයට අපේ ඇති ප්‍රියතාව හේතුවෙනි.



♦ ***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Work Permits and Highly Skilled Migrant Applications done.**
**We also deal with visa refusal from British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place, Colombo 7**
**Tel. 2672432 / 0777686632**